

රූපවාහිනියෙන් කෘෂි දැනුම

රූපවාහිනී නාලිකාව ඔස්සේ සතිපතා විකාශය කෙරෙන ගොවිබිමට අරුණළු වැඩසටහනේ කෘෂි තොරතුරු ඇතුලත් මාසික කලාපය

ගොවිබිමට අරුණළු - 2006.02.05 දින විකාශනය

අලිපේර

පර්සියා ඇමෙරිකානා (*Percea americana*) යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබන අලිපේර මේදය 22.8% ක් ඇති රසවත් පලතුරකි. ශ්‍රී ලංකාව පුරා අලිපේර ප්‍රභේද රාශියක් හමුවෙයි. තෙත් කලාපය පුරා හෙක්: 700ක, 800ක භූමිභාගයක පැතිරී ඇති අලිපේර සඳහා තෙත් සිසිල් දේශගුණය වඩාත් යෝග්‍ය වේ. තෙත් කලාපය තුළ වුවත් අලිපේර මල් හට ගැනීමේ වාරය වෙනස් වන අතර, බදුල්ල, බණ්ඩාරවෙල ප්‍රදේශවල ඔක්තෝබර් මාසයේදීත්, නුවරඑළිය අවට ප්‍රදේශවල පෙබරවාරි, මාර්තු මාසයේදීත්, මහනුවර, මාතලේ ප්‍රදේශ වල මැයි, ජුනි, ජුලි කාලයේදීත් මල් හට ගැනීම සිදුවේ. මේ නිසා අවුරුද්දේ වැඩි කාලයක් අලිපේර ඵලදාව ලබාගත හැකිවේ.

අලිපේර ගස්වල පුෂ්ප පිපෙන්නේ පුෂ්ප පොකුරු ආකාරවය. මේ එක මලක් අපි සලකා බැලුවහොත් එම මල දෙපාරක් විවෘතවේ. පළමුවරට විවෘත වී නැවත ඇකිලී යම්කිසි කාලසීමාවකට පසුව නැවතත් පිපීම සිදුවේ. මෙය අනෙක් පලතුරු වලට වඩා, විශේෂිත හැසිරීම් රටාවකි. අලිපේර මල පළමුව විවෘත වන්නේ ස්ත්‍රී මලක් ආකාරයටයි. ඒ අවස්ථාවේ පරාග පිළිගැනීමට හැකි නමුත් තමාගේ පරාග නිෂ්පාදනයක් සිදුනොවෙයි. එම මලට යම් කිසි කාලයක් හැකිලී නැවත විවෘත වනවිට පිරිමි මලක් ආකාරයට හැසිරේ. මේ අවස්ථාවේදී අලිපේර මලේ ස්ත්‍රී කොටස් අක්‍රිය වී මෙම අවස්ථාවේ පිරිමි කොටස් ප්‍රමුඛ වී ඇත. එනම් පරාග පිටවීම පටන් ගනී. මේ හැසිරීම අනුව අලිපේර ප්‍රභේද කාණ්ඩ දෙකකට බෙදා ඇත. පළමු කාණ්ඩ A ලෙසත් දෙවන කාණ්ඩය B ලෙසත් හඳුන්වා ඇත. A ලෙස සැලකූ කාණ්ඩයේ, එක් මලක් සලකා බැලූ විට පළමුව උදේ වරුවේ පළමුව විවෘත වේ. එවිට එය ප්‍රථමයෙන් ස්ත්‍රී මලක් ආකාරයෙන් හැසිරෙන අතර, නැවත එය විවෘත වන්නේ පසුදින සවස් වරුවේදීයි. එනම් අද හවස ඇකිලී තිබී පහුදින උදේ ඇකිලී නැවත පහුවද හවස විවෘත වේ. පළමුව ස්ත්‍රී මලක් ආකාරයටත් පසුදින පුරුෂ මලක් ආකාරයටත් හැසිරෙයි. B කාණ්ඩය අපි සලකා බැලූවිට B කාණ්ඩයේ අලිපේර මලක් පළමුව විවෘත වන්නේ හවස් වරුවේදිය. රාත්‍රියේදී එය හැකිලී හෙවත් පරවී තිබේ. නැවත මෙය විවෘත වන්නේ පසුදින උදේටයි. එවිට B කාණ්ඩයේ මලක් සලකා බැලූවොත් B කාණ්ඩයේ ශාකයක ඇතිවෙන මලක් සලකා බැලූවිට ඕනම හවස් වරුවක තිබෙන්නේ ස්ත්‍රී මල් වන අතර ඕනම උදේ වරුවක තිබෙන්නේ පිරිමි මල් වේ. මේ B කාණ්ඩයේ මල් පමණක් හැදෙන ගස් පමණක් වගා කලහොත් එක් ගසක පරාගනයක් සිදු වීමට අවකාශයක් නැත. එනම් සලකන අවස්ථාවකදී එම ගසේ තියෙන්නේ එකම වර්ගයක මල් පමණක් නිසාවෙනි.

උදේ පිපී හවස නැවත පිපෙන එසේ නැතහොත් සවස පිපී නැවත පසුදින උදේ පිපෙන මල් වර්ග අතර ස්ත්‍රී සහ පුරුෂ අවස්ථා පැහැදිලිවම වෙන් වී තිබේ. එලෙස වෙන්වීම නිසා පරාගනය සාර්ථකව සිදුවීමට තිබෙන අවස්ථාව අඩුවේ. නමුත් මේ අවස්ථා දෙක හොඳින්ම වෙන්වන්නේ හොඳ හිරු එළියක් තිබෙන දවස් වලදීයි. එමෙන්ම වලාකුළු රහිතව අධික උෂ්ණත්වයක් තිබෙන දින වලදී මේ ස්ත්‍රී සහ පුරුෂ අවස්ථා දෙක පැහැදිලිවම සොයාගත හැකියි. එවිට පරාගනය සිදු වීමට තිබෙන අවස්ථාව හොඳටම අඩු වේ. මේ පැහැදිලි හිරු එළිය වියළි තත්වය එසේ නැතහොත් උණුසුම් තත්වය තිබෙන ප්‍රදේශ වල අලිපේර එක වර්ගයක් පමණකි. වගා කළවිට අපිට බලාපොරොත්තු වියහැකි වෙන්නේ එක්කෝ පිරිමි අවස්ථාවේ තියෙන මල් එසේ නැතහොත් ගැහැණු අවස්ථාවේ තියෙන මල් පමණකි. එවිට පරාගනය වීම තවදුරටත් සීමාවේ. නමුත් සාමාන්‍යයෙන් සාම්ප්‍රදායිකව අලිපේර වගා කරන මධ්‍යම පළාත සීතල ප්‍රදේශ වල ස්වභාවික අලිපේර ගස් විශාල සංඛ්‍යාවක් තිබේ. අලිපේර ප්‍රභේද රාශියක මෙලෙස ස්ත්‍රී සහ පුරුෂ අවස්ථාව

මිශ්‍රවී තිබිය හැකියි. එම පරිසරයකදී අපි A කාණ්ඩයේ හෝ B කාණ්ඩයේ ගස් විශාල වශයෙන් ඇති නිසා පරාගනය සඳහා ගැටළුවක් ඇති නොවේ. නමුත් අනුරාධපුර, පොළොන්නරුව වැනි වියළි ප්‍රදේශවලත් අලිපේර වගා කිරීම කළ හැකිය. ඒවා වගා කරන අවස්ථාවේදී මේ ගැටළුව වඩාත් මතු වේ. හිරු එළිය උණුසුම් තත්ව යටතේදීත් අලි පේර ගස් සුලභ නොවන නිසාත් පිටතින් පරාග, පැමිණීම අඩු නිසාත් එම ප්‍රදේශවල අලිපේර වගාවක් කලහොත් පැහැදිලිවම පරාගනය ගැටළුවක් විය හැකියි. එම නිසා එම ප්‍රදේශවල අලිපේර වගා කරන විට විවිධ ප්‍රභේද කිහිපයක් වගා කිරීම අනිවාර්යයයෙන්ම කළ යුතුයි.

ගොටුකොළ

අතීතයේ සිටම ගොටුකොළ ශ්‍රී ලාංකිකයන් අතර ඉතාම ජනප්‍රිය පලා වර්ගයකි. එයට ආවේණික වූ විශේෂ රසයක් ඇති නිසා ගොටුකොළ සඳහා වෙළඳපොලේ හොඳ ඉල්ලුමක් තිබේ. මෙහි ඖෂධීය ගුණ ඇති බව ආයුර්වේදයේ දැක්වෙන අතර යකඩ බහුල පලා වර්ගයක්ද වේ. ජලය සැපයීමට පහසු ඕනම ස්ථානයක ගොටුකොළ වගාව කල හැකිය. වෙල් ප්‍රදේශ වල විසිරුම් ජල සම්පාදනය යටතේ සාර්ථකව ගොටුකොළ වගාව කල හැකිය. තවද වගුරු බිම් ආශ්‍රිතව ඇති මඩ සහිත පස් ගොඩ කර ලැබෙන බිම් වුවත් සාර්ථකව ගොටුකොළ වැනි පලා වර්ග වලා කළ හැකි බව ගොවිමහතුන් තම අත්දැකීමෙන් දනී. යායක් ලෙස විශාල ලෙස ගොටුකොල වගා කිරීමේදී රෝග හා පලිබෝධ හානි වලට පාත්‍රවීමේ ප්‍රවණතාවයක් තිබේ.

මෙලෙස ඇති විය හැකි එක් රෝගී තත්වයක් ලෙස දිලීර ආසාදනය හැඳින්වීමට හැකියි. මෙහිදී ගොටුකොල පත්‍ර වල දුඹුරු පැහැ පැල්ලම් ඇති වේ. ගොටුකොළ නටු වලට ආසාදනය සිදු වූ විට නටුවේ දුඹුරු පැහැ පැල්ලම් ඇති වී අල්ලන විට දෙකට කැඩීමක් සිදුවේ. මෙය ආර්ථිකව විශාල පාඩුවකි. "මලකඩ රෝගය නිසා මෙය සිදුවේ. මෙය දිලීර අසාදනයකි. මෙය අපට පහසුවෙන් පාලනය කර ගත හැකියි. විශේෂයෙන්ම කොළ කපා ඉවත් කළ පසු එනම් වෙළඳපොළට යැවූ පසු ඉපනැල්ලට යෙදිය හැකි දිලීර නාශකයක් යොද ගත යුතුයි. ෆොලිකර් මෙවැනි යොදගත හැකි දිලීර නාශකයකි. ෆොලිකර් 3.5ml ක් වතුර ලීටර් 10 ක දියකර කපා ඉවත් කල ඉපනැල්ලට ගැසීමෙන් මෙය පාලනය කරගත හැක.

ගොටු කොළ වගාවට හානි කරන එක් පළිබෝධ හානියක් වශයෙන් මයිටා උවදුර හැඳින්විය හැකිය. මයිටා උවදුර ඇති වූ විට ගොටුකොළ වගාවේ කොළපැහැය ක්‍රමයෙන් අඩුවී සුදු පැහැයට හැරේ. කොළ වල යටි පැත්ත පරීක්ෂා කර බැලූ විට රතු පැහැති ඉතා කුඩා මයිටාවන් සිටිනු දැකගත හැකියි.

මෙවැනි වගාවක් තිබේනම් නිසි පාලන කටයුතු අනුගමනය කිරීම වැදගත්ය. පළමුවෙන් මේ වගාව කපා ඉවත් කර එක්කෝ වෙලඳපලට හෝ වෙලඳපලට යවන තත්වයකින් නැත්නම් වලලා දැමීම කළ යුතුයි. ඉතුරුවෙන ඉපනැල්ලට ජලද්‍රාව්‍ය s 80g ක් වතුර 10 L ක දිය කර යෙදිම කළ හැකියි. පළමු වර යොදා දින 3 කින් නැවතවරක් යෙදිම කළ යුතුයි. එසේ පමණක් එහෙම යොදන්න තියන්නේ S වලින් මරන්නේ වැඩුණු සතුන් සහ ඔවුන්ගේ පැටවුන් විතරයි. පළමු යෙදීමෙන් බිත්තර විනාශ වන්නේ නැත. බිත්තර වලින් බිඳී එන සත්තු මරන්න නැවත දින 3 න් යෙදිම කළයුතුයි. එවිට මේ සතාව පලිබෝධකයාව පාලනය කරගත හැකියි.

ගොටුකොළ වගාවේ අපි කවුරුත් දන්නා තවත් අසාදනයක් තමයි මුල්වල හා කඳ මුල ඇතිවෙන තඩිස්සි වීම. මෙය වටපණු හානියක් නිසා ඇතිවෙන තත්වයකි. මේ වටපණු හානිය නිසා ගොටුකොළ පත්‍ර සිහින් වී වර්ධනය අඩුවේ. මෙය ආර්ථිකව විශාල පාඩුවකි. වටපණු හානිය මර්ධනයට ක්‍රම කිපයක් තිබේ.

"වටපණු ආසාදනයට ලක්වුනු ක්ෂේත්‍රයකින් අපි පැළ ගෙනවිත් අළුත් ක්ෂේත්‍රයේ සිටවූ විට එමඟින් මේ හානිය බෝවීම සිදුවේ. මෙය කුඩා පණුවෙක් වැනි සතෙක් මුලට ඇතුල් වී ඉන්පසු මුල් තුළ ගැටිති හද ගැනීම නිසයි මේ ආසාදනය ඇතිවෙන්නේ. මෙය පාලනය කරගැනීමට තිබෙන හොඳම ක්‍රමය වන්නේ පසට කුකුල් පොහොර යෙදීමයි. නමුත් ගොවිමහත්තුරු තම වගාවට කුකුල් පොහොර යොදන නමුත් ඒ යොදන ක්‍රමය මේ සතා පාලනය කර ගැනීමට සාර්ථක ක්‍රමයක් වන්නේය. ගොවි මහත්වරු මේ කුකුල් පොහොර යොදන්නේ අස්වැන්න කපාගත් පසුවයි. මොවුන් වගාව උඩට තමයි කුකුල් පොහොර යෙදීම සිදුකරන්න. එහෙම යොදලා වැඩක් නෑ. මේ වගේ වගාවක් තියෙනවානම් කලයුතු හොඳම, පාලනය කලයුතු හොඳම මාර්ගය තමයි මේ වගාව ක්ෂේත්‍රයෙන් ඉවත් කරලා ඒකොටස් වලලලා, පුච්චලා දාන්න ඕනේ.

රෝග හා පලිබෝධ මර්ධනයත්, ජල සැපයුම නිසිඅයුරින් සිදු කිරීමත්, පොහොර යෙදීමත්, වල් මර්ධනයත් නිසි නඩත්තුවක් සහිතව සිදුකිරීමෙන් හා නිසි කලට අස්වනු නෙලීමත් යන කරුණු හරියාකාරව සිදු කිරීමෙන් අපට ගොටුකොල වගාවෙන් ගුණාත්මක අස්වැන්නක් වගේම වෙළඳ පොලේදී ඉහල මිලක්ද ලබා ගන්න පුළුවන්.

මීයන් මගින් වී වගාවට සිදුවන හානිය අවම කිරීම

හැඳින්වීම

මීයා කෝඩේටා වංශයට අයත්ය. එනම් මිනිසා මෙන්ම පෘෂ්ඨ වංශිකයෙකි. එමෙන්ම මැමේලියා වර්ගයට අයත්ය. එනම් මිනිසා මෙන්ම කිරි බී වැඩෙන සතෙකි. පළිබෝධකයින් විශාල සංඛ්‍යාවක් සිටින ආත්‍රෝපෝඩා වංශයට අයත් ඉන්සෙක්ටා වර්ගිකයන් මෙන් නොව මිනිසාට යම් කිට්ටු සම්බන්ධතාවයක් දක්වන මීයන් පාලනය තරමක අසීරු කටයුත්තකි. මේ සඳහා අවශ්‍ය වන්නේ මීයන්ගේ ගති ලක්ෂණ හැසිරීම් රටාව, බෝවීම, භෝජන රටා ආදී කරුණු හොඳින් අධ්‍යයනය කොට ඒවාට ගැලපෙන පරිදි පාලන උපක්‍රම උපයෝගිකර ගැනීමයි.

රොඩනේටිය ගෝත්‍රයට හා මුරිඩේ පවුලට අයත් වෙල්මීයා බැන්ඩිකෝටා බෙන්ගාලෙන්සිස් යන නමින් හඳුන්වයි. ප්‍රමාණයෙන් මෙම මීයන්ට වඩා කුඩා කහ පැහැයට හුරු, දුඹුරු පැහැති මීයන් විශේෂයක් ද සමහර කුඹුරුවල දක්නට ලැබේ. මෙම මීයන් රටිමුස් රටිමුස් යන විද්‍යාත්මක නමින් හඳුන්වයි.

ශ්‍රී ලංකාවේ මීයන්ගේ හානිය බහුල ලෙස දක්නට ලැබෙන්නේ කෑගල්ල, රත්නපුර, කළුතර වැනි තෙත් කලාපයට අයත් දිස්ත්‍රික්කවලය. මෙයට හේතුව මෙවැනි ප්‍රදේශවල කුඹුරුයාය කුඩාවීම, එම කුඹුරු අවට වල් ගහනය අධික වීම හා නියර මත හා කුඹුරු අවට පඳුරු වැනි දිරායන ශාක කොටස් බහුලව පැවතීමයි. මෙවැනි පරිසරයන් තුල මීයන්ට සැඟවී සිටිය හැකි ස්ථාන බහුලවීම, මී ගහනය වැඩි වීම හේතුවී තිබේ. එමෙන්ම අනවශ්‍ය ලෙස පළල් වූ නියර වල මී ගුල් අධිකව දක්නට ලැබෙන අතර, මේ නිසාම මී ගහනයද වැඩි වේ.

මී ගහනය අධික වීම නිසා අස්වැන්න විනාශ වන අතර, මී උණ, මහාමාරිය වැනි භයානක රෝග පැතිරීම සිදුවේ. එක් මීයෙකුට එක් රැයකදී ගොයම් රිකිල් 70 ක් කපා දැමිය හැකි බව සොයා ගෙන ඇත. මේ අනුව මීයන් 4 - 5 දෙනෙකු විසින් එක් රැයකදී වී කිලෝවක අස්වැන්නට හානියක් සිදුකරයි. මොවුන් එක් මී ගුලක් තුළ වී කිලෝ දෙකක පමණ තැන්පත් කරයි. මෙලෙස ගබඩා කරන ලද ආහාර, ගොයම් කපා සති 2 - 3 ක් පමණ කාලයක් ප්‍රයෝජනයට ගන්නා අතර, පසුව ආහාර සොයා වෙනත් ස්ථානවලට ගමන් කරයි. විශේෂයෙන් වී ගබඩාවල මීයන්ගේ හානිය බහුලව සිදුවේ.

වෙල් මීයාගේ ගහනය වැඩිවීමට බලපාන ප්‍රධාන කරුණු තුනකි. වෙල් මීයා වී වගාවේ මල් සලකුණු වන අවධියේ සිට ගොයම් කපා ටික කලක් යනතුරු කුඹුරේ ඝනාවාසීව සිටීමට ඇති කැමැත්ත මින් පළමු වැන්නයි. ගැහැණු මීයන් වැඩෙන වී කරල් අනුභව කිරීමෙන් පසුව ඔවුන් කිරි වැරීමට පෙර දීම ප්‍රජනක වශයෙන් සක්‍රිය වීම දෙවැනි කරුණයි. තුන්වන කරුණ වනුයේ මෙම ගැහුණු මීයන් කිරිවැරීමට පෙර දෙවන වතාවට පැටවුන් බිහිකිරීමට ඇති හැකියාවයි. මෙනිසා මල් සලකුණු වන අවධියේ සිට අස්වැන්න නෙලන කාලය වන විට මොවුන් දෙවතාවක් පැටවුන් බිහි කරයි.

මීයන්ගේ හානිය පැල සිටුවා සති 4 - 7 කාලයේ ඉතා අඩු තත්වයේ පවතින අතර, පැල සිටුවා සති 7 කින් පසු හෝ වී ඉසිමෙන් සති 10 කට පසුව මීයන්ගේ හානිය අධික වේ. මීයාගේ හානිය හඳුනාගත හැක්කේ 45 කෝණයක රිකිලි කපා තිබීම මගිනි. නියරක සිට මීටරයක් වඩා ඇතින් මෙලෙස රිකිලි කපා දැමීම සිදුකරයි. නියර ආසන්නයේ ඇති මී පස් මගින් ද මීයන්ගේ හානිය හඳුනා ගත හැක. මීයන්ගේ ගමන් මාර්ග ද මීයන්ගේ හානිය පවතින බවට සාධකයකි. ක්ෂේත්‍රය තුළ මී බෙටි ප්‍රමාණය අධ්‍යයනය කිරීම මී හානිය හඳුනා ගැනීමේ තවත් සාධකයකි.

මීයන්ගේ හානිය අවම කර ගත හැක්කේ පාලන උපක්‍රම හැකිතාක් ඒකාබද්ධ කිරීම මගිනි. මීයන්ගේ හානිය අවම කිරීම සඳහා කල හැකි හා කල යුතු වැදගත්ම කරුණ මීයන් බෝවන ස්ථාන විනාශ කිරීමයි. කුඹුරක සිට මීටර් 50 ක පමණ දුරක් වල් ගහනයෙන් තොරව තබා ගැනීම හා නියර වල මී ගුල් කොටා විනාශ කොට එය හැකිතාක් පටුවන සේ ශක්තිමත්ව බැඳීම මේ සඳහා වැදගත් වේ. කුඹුර වටා පොලිතින් ආවරණයක් සවි කිරීම ද මී හානිය වලක්වා ගැනීමේ ක්‍රමයකි. ගැරඬින් වැනි විලෝපිකයන් මගින් මීයන්ගේ ගහනය අඩු වේ. මෙනිසා මෙවැනි සතුන් ආරක්ෂා කල යුතුය. වී ඉසිමෙන් සති 2 - 3 පසුව මී පාසානම් තැබීම මීයන් පාලනය සඳහා ඇති තවත් ක්‍රමයකි. මෙහිදී යායක් තුළ ගොවීන් සාමුහිකව මී පාසානම් තැබිය යුතුය. මෙය වාර කිහිපයක් තැබිය යුතුයි. මී පාසානම් නොකන අවස්ථාව මීයන් නැති අවස්ථාව ලෙස සැලකිය යුතුයි.මීයන් මර්ධනය කිරීම සඳහා පොස්පින් වායුව භාවිතා කල යුත්තේ වෙනත් විකල්පයක් නොමැති නම් පමණී.

කානේෂන් වගාව

ජීවිතය ජයගන්න වෙරදරන දිරිය මිනිසුන්ට කෘෂිකර්මාන්තය මහඟු අත්වැලක් වේ. වර්තමානයේ කෘෂිබෝග දෙස් විදෙස් වෙළඳපොළ ජයගනිමින් ගොවි ආර්ථිකය ඉහළ නැංවීමට දයක වී තිබෙනවා. එවැනි කෘෂි බෝග අතරත්, ඉහළ ස්ථානයක් කැපුම් මල්වලට හිමි වී තිබෙනවා.

කැපූ මල් ව්‍යාපාරිකයන් අතර ප්‍රචලිතව ඇති රෝස, ඕකිඩ් වැනි මල් වර්ග වගේම කානේෂන්ද වටිනා වානිජ වගාවක් ලෙස හැඳින්විය හැකිය. එසේ වීමට එක් හේතුවක් වන්නේ කැපූ මලක් මාස 6කට ආසන්න කාලයක් කල් තබාගත හැකි වීමයි. අපේ රටේ මුහුදු මට්ටමේ සිට අඩි 5000කට වඩා උස්බිම්වල කානේෂන් වගා කළ හැකියි. මේ ප්‍රදේශවල ස්භාවයෙන්ම පවතින දේශගුණික රටාව ශාකයේ නියම ස්වරූපය මතු කර දීමටත් මලෙහි ගුණාත්මය රැකදීමටත් සමත් වීම අප ලද වාසනාවක්වේ.

උද්භිද විද්‍යාත්මකව ඩයන්තස් කැරියෝපිලස් නමින් හඳුන්වන කානේෂන් අයත් වන්නේ කැරියෝපිලේසියේ කුලයටයි. ප්‍රධාන වශයෙන් කානේෂන් වර්ග දෙකක් හඳුනාගත හැකි අතර, එක් වර්ගයක් ස්ප්‍රේ කානේෂන් ලෙස හඳුන්වනු ලබනවා. මෙහි මල් හට ගන්නේ පොකුරු වශයෙන්. තනි මලක් හටගන්නා අනෙක් වර්ගය ස්ටෑන්ඩඩ් කානේෂන් ලෙසයි හඳුන්වයි. මෙම වර්ග දෙකෙහිම රතු සුදු, කහ සහ තැඹිලි වැනි විවිධ වූ වර්ණ සහිත මල් දැකගත හැකියි.

අනෙකුත් බෝග සමඟ සසඳන විට වර්ගමීටර් 100ට ලක්ෂයක් පමණ වියදම් වේ. මාස 6කට පසු මාස්පතා රුපියල් 15,000/- කට වැඩි ආදයමක් උඩරට වැවෙන අනෙකුත් කෘෂිබෝග හා සසඳ බැලීමේදී කානේෂන් වලින් වඩා වැඩි මාසික ආදයමක් උපයා ගත හැකියි. ශ්‍රී ලංකාවේ ස්වාභාවික දේශගුණය කානේෂන්වල ගබඩා තත්ත්වය උසස් අයුරින් තබා ගැනිමට ඉවහල් වීම විශේෂ වාසියකි. බැක්ටීරියා දිලීර රෝග වලින් ආරක්ෂාකර ගැනීම සඳහා ආරක්ෂිත ගෘහ තුළ වගා කිරීම අත්‍යාවශ්‍ය වේ.

මෙවැනි ආරක්ෂිත ගෘහයක කානේෂන් වගා කිරීමට වර්ගමීටර් 100ක් සඳහා මූලික වියදම ලක්ෂයක් වැය වුවත් මාස 5-6කින් පසුව මාසිකව අනිවාර්ය ආදයම රුපියල් 15,000/-ක් පමණ වේ.

වානිජ වගාවක් ලෙසින් කානේෂන් වගාවට යොමු වන්නේ නම් ආරක්ෂිත ගෘහයක් භාවිතා කිරීම අවශ්‍ය වෙනවා. වගාව සඳහා අඩි 3ක් පළල අවශ්‍ය තරම් දිගට පාත්ති සකසා ගත හැකියි. මෙහිදී අඩි 1 1/2ක් ගැඹුරින් පාත්තියේ පතුලට සුදු පොලිතීනයක් ඇතිරීම අවශ්‍ය වෙනවා. වගා මාධ්‍ය ලෙස කොහුබත් කොටස් 1ක් හා වැලි කොටස් 1ක මිශ්‍රණයක් භාවිතා කළ හැකියි. මේ අවස්ථාවේදී මූලික පොහොර මිශ්‍රණය ලෙස වර්ග මීටර් 100කට

ඇමෝනියම් නයිට්‍රේට් කි.ග්‍රෑ. 1 1/2ක්
ට්‍රිපල් සුපර් පොස්පේට් කි.ග්‍රෑ. 1 1/2ක්
මියුරියේට් ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ. 1 1/2 ක මිශ්‍රණයක්

වගා මාධ්‍යයට එක් කළ යුතුයි.

පැළ සිටුවීමට පෙර ආධාරක සිටුවීම සහ ඒ ආශ්‍රයෙන් පොලව මට්ටමේ සිට අඟල් 5ක් පමණ ඉහළින් කොටු දැලක් ආකාරයට තංගුස් නූල් ගැට ගසා ගැනීම කළ යුතුයි. ශාකය සෙමෙන් වර්ධනය වන විට අඟල් 5-6ක පරතරයකින් යුතුව මෙවැනි දැල් තට්ටු 5ක් සකසා ගැනීම ශාකය සෘජුව පවත්වා ගැනීමට ඉවහල් වෙනවා. පැළ සිටුවීමේදී පැල දෙකක් අතර පරතරය අඟල් 5ක් වන ලෙසත් දෙපේළි දෙකක් අතර පරතරය අඟල් 10ක් වන ලෙසත් පැළ සිටුවීම කළ යුතුයි. එවිට එක් ස්ථානයක පැල 4ක් දැකිය හැකිවේ.

කානේෂන් වගාවක් ක්‍රමාණුකූලව නඩත්තු කරන්නේ නම් පැළ පුහුණු කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක්. පැළයේ පත්‍ර යුගල් 5ක් ඇති අවස්ථාවේ අග්‍රස්ථ කොටස කඩා ඉවත් කිරීම මෙහි මුල්ම පියවරවේ. පසුව එම පැලයේ රිකිලි 5ක් වර්ධනය විමට ඉඩහැරිය යුතුයි. මේවායින් හොඳින් වර්ධනය වූ රිකිලි දෙකක අග්‍රස්ථ කොටස කඩා ඉවත් කිරීම පැළ පුහුණු කිරීමේ දෙවන පියවරයි. පසුව එම රිකිලි දෙකෙහි තවත් රිකිලි 5ක් බැගින් වර්ධනය වීමට ඉඩහරින අතර අනෙක් රිකිලි තුන මල් පිපීම සඳහා වර්ධනය වීමට ඉඩහරී. මෙලෙස පුහුණු කළ ශාකයකින් වසර දෙකකදී මල් 20-25ක් පමණ ලබා ගතහැකියි.

ගුණාත්මක මල් ලබා ගැනීම සඳහා වගාවට නිර්දේශිත පොහොර ප්‍රමාණයන් නිසි කලට යෙදීමද වැදගත් වේ. සති තුනකට වරක් ඇමෝනියම් නයිට්‍රේට් කි.ග්‍රෑ. 5ක්

ද සති 4කට වරක් මියුරියේට්ඔෆ් පොටෑෂ් කි.ග්‍රෑ. 8ක් සති 6කට වරක් ට්‍රිපල් සුපර් පොස්පේට් කි.ග්‍රෑ.4ක් හා සති 3-4කට වරක් කැල්සියම් නයිට්‍රේට් කි.ග්‍රෑ.2-3ක් පමණ වර්ග මීටර් 100ක් සඳහා අමිශ්‍ර පොහොර ලෙස යෙදීම නිර්දේශ කරයි.

වගාවට ජලය සැපයීමේදී පත්‍ර හෝ ශාකය තෙමී යන ලෙස ජල සම්පාදනය නොකළ යුතු අතර පාත්තිය තෙමෙන සේ ජලය සැපයීම සැලකිය යුතු කරුණකි. කානේෂන් වගාවක මල් අස්වනු ලබා ගැනීමේදී සුදුසුම අවස්ථාව වන්නේ මල විවෘත වීමට පෙර නෙලා ගැනීමයි. නෙළා ගත් මල් ජල බඳුනකට දැමිය යුතු අතර ඒවා ප්‍රවේශමෙන් අසුරා වෙළඳපලට සැපයීමෙන් සරු ආදායමක් ලබා ගත හැකිවේ.